TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele: (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax: (94) 11 2 501 707
Email: tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපළ සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර,
කොළඹ 05.
2019.11.01

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>**දේශපාලන පක්ෂයක් සහ ජනාධිපතිවරණ අපේක්ෂයෙකු ප්‍රවර්ධනය වන අයුරින් රාජ්‍ය මුදල් අවභාවිතා වීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා**</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ලැබී ඇති පැමිණිල්ලකට අනුව 2019.10.25 වන දින දිනමිණ පුවත්පතේ 'සමෘද්ධි' අතිරේකය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර තිබිණි.ඒ සඳහා රුපියල් 690 000 ක පමණ මුදලක් රජයේ මුදලින් වැය වී ඇති අතර ඒ මුදල අදාළ අමාත්‍යාංශය විසින් දරා ඇති බවට වාර්තා විය.එයට අදාළ ඡායා පිටපත් මේ සමග අමුණා ඇත.

මෙලෙස රාජ්‍ය ආයතන හා රාජ්‍ය මුදල් ජනාධිපතිවරණයට සම්බන්ධ පක්ෂයක් ප්‍රවර්ධනය වන ආකාරයට යොදා ගැනීම තුලින් එක් ජනාධිපතිවරණ අපේක්ෂයෙක් ප්‍රවර්ධනය වන බැවින් ඒ සඳහා අවශ්‍ය නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංඛී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතාගේ 076 322 344 2/076 322 366 2 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි.පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේදී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තූතියි.

මෙයට,

විශ්වාසී.

Lakwijaya Bandara
..............................

ලක්විජය බණ්ඩාර.
ජාතික සම්බන්ධීකාරක. (PPPR)

Chairperson: S.C.C. Elankovan
Company Secretary: Charuni Gunawardana
Directors:

වෂ් 2019ක් වූ ඔක්තෝබර් මස 25 වැනිද සිකුරාද

# සමෘද්ධි

සැබෑ මෙහෙවරක ඇරඹුම

දිනමිණ



# ආබාධිතයන්ට වසරකට රු. දස ලක්ෂ හාරසිය තිස් එකක් ලබා දීමට අපි ක්‍රියා කළා

**ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් ඇමැති දයා ගමගේ**

ආබාධ සහිත පුද්ගලයන්ට ලබා දෙන ප්‍රතිලාභ ප්‍රමාණය වැඩි කරමින් ඔවුන්ට වසරකට රුපියල් දස ලක්ෂ 431ක මුදලක් ලබා දීමට කටයුතු කළ බව ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් ඇමැති දයා ගමගේ මහතා පැවසී ය.


"වාර්ෂික ව පවත්වනු ලබන විශේෂ හැකියා සහිත දරුවන්ගේ ජාතික සංස්කෘතික ප්‍රසංගය 'සිත් රූ - 2019" කොළඹ 07, නෙළුම් පොකුණ රඟහලේ දී පසුගිය 26 ද පැවැත් වූ අවස්ථාවේ දි ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ය.

මෙරට සිටින ආබාධ සහිත දරුවන්ගේ විශේෂ හැකියා කෙරෙහි අවධානය යොමු කළ අමාත්‍යාංශය ගම් මට්ටමෙන් එම දරුවන් තෝරා මේ සංස්කෘතික ප්‍රසංගයට ඉදිරිපත් කර තිබේ.

එහිදී වැඩිදුරටත් අදහස් දක් වූ ඇමැතිවරයා,

"ආබාධ සහිත පුද්ගලයන් 32,000කට මාසිකව රුපියල් 5000 බැගින් වසරකට රුපියල් 60,000ක මුදලක් ලබා දුන්නා. මෙවර අය වැයෙන් තව ආබාධ සහිත පුද්ගලයන් 42,000ක් එක් කළා. මේ අනුව අද වන විට පූර්ණ ආබාධ සහිත පුද්ගලයන් 74,000ක පමණ ප්‍රමාණයක් මේ දීමනාව ලබනවා. මේ අනුව මේ ආණ්ඩුවෙන් වසරකට රුපියල් දස ලක්ෂ හාරසිය තිස් එකක මුදලක් ලබා දෙනවා. එය තවත් වැඩි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

'සෙනෙහස' ලොතරැයිය ආරම්භ කිරීමට මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා තිබෙනවා. නිලධාරීන් මට ඒකට ඉඩ දුන්නේ නැහැ. එය කළා නම්, එයින් ලැබෙන ආදායමෙන් විශේෂ හැකියා ඇති පුද්ගලයන් විශාල ප්‍රමාණයකට සේවාව ලබා දෙන්න තිබුණා.



ආරම්භක පියවරක් වශයෙන් බත්තරමුල්ල සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරී එම්. වසන්ත පුෂ්පකුමාර මහතාට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා අතින් චෙක්පත් ප්‍රදානය කළ අයුරු.

ඡායාරූප - සරත් පීරිස්

# සමෘද්ධි සේවකයන්ට සමෘද්ධි බැංකුවෙන්ම ණය ලබා දීම ඇරඹේ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සමෘද්ධි බැංකු මඟින් පාරිභෝගික සේවා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේ;

සමෘද්ධි වැඩසටහන් පෝෂණය කිරීම සඳහා දායක වූ කාර්ය මණ්ඩලය වෙත සමෘද්ධි බැංකු මඟින් ම මේ ණය ලබා දීම ආරම්භ කර ඇත. කාර්ය මණ්ඩල මුදල් අවශ්‍යතා සඳහා වෙනත් මූල්‍ය ආයතන මඟින් ණය ලබා දීමේ දී මුහුණ දෙන විවිධ දුෂ්කරතා අවම කිරීම, තමා සේවය කරන ආයතනය තුළින් ම ණය මුදලක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමෙන් තම ආයතනය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, සේවක අභිමානය වර්ධනය කිරීම, කාර්ය මණ්ඩල අභිප්‍රේරණය, සමෘද්ධි බැංකු තැන්පතු ණය අනුපාතය ඉහළ දැමීම හා සමෘද්ධි බැංකු ණය උඩ ප්‍රසාරණය කිරීමට නව ණය ක්‍රමය හඳුන්වා දීම ප්‍රධාන අරමුණු ය. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පූර්ණ කාලීන රාජකාරිවල නියුතු සියලු ම නිලධාරීන්ට මේ ණය ඉල්ලුම් කළ හැකි ය.

ණය ඉල්ලුම්කරුට මේ යටතේ උපරිමය රුපියල් ලක්ෂයක් පාරිභෝගික ණය ලෙස ලබා ගත හැකි ය. ඔහුගේ/ ඇයගේ මාසික දළ වැටුප මත එය තීරණය කෙරේ. මාසික පොලී අනුපාතය 1%කි. මෙහිදී තම දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතාව සඳහා, පවුල් හදිසි ආපදාවක දී අවශ්‍ය වන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට, නිවසේ සුළු ඉදිකිරීම් හෝ අලුත්වැඩියාවන් සඳහා ස්වභාවික ආපදා තත්ත්වයකින් ඇති වන මූල්‍යමය දුෂ්කරතා මඟහරවා ගැනීමට වෙනත් පිළිගත හැකි හදිසි මූල්‍ය අවශ්‍යතාවලට තම අවශ්‍යතාව පිළිබඳ ලිඛිත දැනුම් දීමක් කිරීමෙන් බැංකු කළමනාකරුට ඔවුන් වෙත ඒ සඳහා ණය ලබා දිය හැකි වේ.

රාජ්‍ය සේවයේ වසරක සේවා කාලයක් ඇති රාජ්‍ය නිලධාරියකු හෝ සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන්ට මේ සඳහා ඉල්ලීම් කළ හැකි ය.


# වියළි බිමට වස්සන අසිරි වැසි

ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් චීන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් ශ්‍රී ලංකාවේ වියළි කලාපීය කෘෂි බිම් සඳහා කෘත්‍රිම වැසි මඟින් ජල සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සංවිධානය කොට ඇත.

ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය දයා ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා බත්තරමුල්ල සුහුරුපායේ දී එහි සමාරම්භක උළෙල පැවැත්විණි.



අමාත්‍යාංශ ලේකම් අශෝකා අලවත්ත, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමන් බණ්ඩාර සහ ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන් මෙන්ම චීන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.




**සමෘද්ධි පිළිසඳර නැවතත්**

අලුතෙන් හිතන දිරියෙන් නැගිටින දිරිය මිනිසුන්ගේ ජීවිත කළඑළි කරනාගුවන් විදුලි හෝරාව නැවතත් සෑම සෙනසුරාදාවකම පෙ.ව.9.00 සිට 10.00 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙළෙඳ සේවයෙන් FM 94.03, FM 94.5 සවන් දෙන්න.